# කුඹුරු විදුලි වැට සහ ග්‍රාමීය විදුලි වැට භාවිතය පිළිබඳ මාර්ගෝපදේශ සටහන



- ඔබගේ කුඹුරට අලින්ගෙන් තර්ජනයක් පවතී නම් ඔබ ගොවි සමිතිය මඟින් ‘කුඹුරු විදුලි වැටක්’ නිර්මාණය කර ගැනීමෙන් ඔබ කුඹුරු යාය ආරක්ෂා කර ගත හැක.
- 'කුඹුරු විදුලි වැට' ස්ථාපනය සහ නඩත්තුව පූර්ණ වශයෙන්ම ගොවි මහතුන් විසින් සිදු කරයි.
- 'කුඹුරු විදුලි වැට' ස්ථාපනය වන්නේ කුඹුරු යායේ මායිමේය.
- 'කුඹුරු විදුලිවැට' කාලීන වැටකි. එය වගාව ආරම්භයේ ඉදිවෙන අතර අස්වැන්න නෙලන කල හකුලා ඊළඟ කන්නය තෙක් ගමෙහි සුදුසු ස්ථානයක තැන්පත් කෙරේ.
- යායක ‘කුඹුරු විදුලි වැටක්' ස්ථාපනයට ගත වන්නේ දවසක පමණ කාලයකි. එය හකුලා ඉවත් කිරීමට වරුවක පමණ කාලයක්ද ගත වේ.
- 'කුඹුරු විදුලිවැට' ඔබගේ කුඹුරට අලින්ගෙන් වන හානි වලින් ක්ෂණික සහනයක් ලබා දෙන අතර, එමගින් කුඹුරු රැකීමේ අවශ්‍යතාවය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවනු ඇත.
- ගොවිජන සේවා දෙපාර්තමේන්තු කාර්යාල හරහා 'කුඹුරු විදුලි වැට' ස්ථාපනයට අවශ්‍ය කටයුතු සිදු කරයි.

- ඔබගේ ගෙවත්ත සහ නිවසට අලින්ගෙන් තර්ජනයක් පවතී නම් සෙසු ගම්වාසීන්ද එකව 'ග්‍රාමීය විදුලි වැටක්' ස්ථාපනය කරගැනීමෙන් ගමෙහි පිහිටි සියලු නිවෙස් සහ ගෙවතු ආරක්ෂා කර ගත හැක.
- 'ග්‍රාමීය විදුලි වැට' ස්ථාපනය සහ නඩත්තුව පූර්ණ වශයෙන් ගම්වාසීන් විසින් සිදුකරයි.
- 'ග්‍රාමීය විදුලි වැට' ස්ථිර වැටකි. එය ස්ථාපනය වන්නේ ගෙවතු මායිම්වලය.
- 'ග්‍රාමීය විදුලි වැට' මගින් ඔබට අලින්ගෙන් වන විපත් ගැන බිය සැක නැතිව රාත්‍රියේ සුව නින්දක් ද ගම තුළ සෘජු ආරක්ෂාවක් ද ක්ෂණිකව ලබා දෙයි.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළින් අදාල ප්‍රජාවට 'ග්‍රාමීය විදුලි වැට' ස්ථාපනයට අවශ්‍ය කටයුතු සම්පාදනය කරයි.
- CSIAP ව්‍යාපෘතිය මගින් දැනට තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශවල විදුලි වැට ස්ථාපනයට අවශ්‍ය තාක්ෂණික දැනුම සහ මූල්‍ය දායකත්වය ලබා දෙයි.